පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව - උතුරු මැද පළාත
மாகாணக் கல்வித் திணைக்களம் - வட மத்திய மாகாணம்
DEPARTMENT OF EDUCATION – NORTH CENTRAL PROVINCE

ශ්‍රේණිය 09

# තෙවන වාර පරීක්ෂණය - 2023

විෂයය :- කතෝලික ධර්මය I,II

පාසලේ නම : ..............................................................................

ඇතුළත්වීමේ අංකය : ..............................

කාලය : පැය 03.වි.10යි

## I කොටස

**සියලුම ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.**
**නිවැරදි පිළිතුර යටින් ඉරක් අඳින්න.**

1. ශුද්ධ බයිබලයේ පුරාණ ගිවිසුමට අයත් තෝබිත් සහ නෙහෙමියා පොත් අයත් වන්නේ
   I. පංච පුස්තකය  II. ඉතිහාස පොත්
   III. ප්‍රඥා සාහිත්‍ය  IV. දිවැසිවර පොත්
2. පුරාණ ගිවිසුමට අයත් පස්වන පොත් කාණ්ඩය වන්නේ
   I. පංච පුස්තකය  II. ප්‍රඥා සාහිත්‍ය
   III. ඉතිහාස පොත්  IV. එළිදරව්ව සාහිත්‍ය
3. මුල් කිතුණු සභාවේ ආරම්භය හා වර්ධනය වූ ආකාරය සඳහන් ග්‍රන්ථය
   I. ලූක් සුභාරංචිය  II. මතෙව් සුභාරංචිය
   III. හෙබ්‍රෙව් ලිපිය  IV. ක්‍රියා පොත
4. අපෝස්තුළුවරුන්ගේ නායකයා වන මෙතුමා විසින් ලියන ලද ලිපි 2කි.එනම්
   I. 1 පේදුරු,2 පේදුරු  II. 1 තිමෝති,2 තිමෝති
   III. 1 ජොහාන්,2 ජොහාන්  IV. 1 තෙසලෝනික,2 තෙසලෝනික
5. “ගී කළඹ” යනුවෙන් හඳුන්වන පොත
   I. තොබිත්  II. ගීතාවලිය
   III. ප්‍රේම ගී  IV. නෙහෙමියා
6. ධර්මිශ්ඨ ජීවිතයක් ගත කිරීමට මග පෙන්වන ඉගැන්වීම් ඇතුළත් ගීතිකා වන්නේ
   I. තුති පිදීමේ ගීතිකා  II. විශ්වාසයේ ගීතිකා
   III. ප්‍රඥා ගීතිකා  IV. රාජකීය ගීතිකා
7. ඉශ්‍රායෙල්වරුන් බොරු දෙවිවරුන්ට තනා තිබූ සියලු පූජාසන විනාශ කොට යුද්ධයකට සේනාව රැස් කලේ.....................ය.
   I. ෂම්ගර්  II. සැමසොන්
   III. ඉබ්ශාන්  IV. ගිබියොන්
8. රෝම අධිරාජ්‍යයේ පීඩන හමුවේ කිතුණුවන් දිරිමත් කිරීමට ලියන ලද සුභාරංචිය
   I. ජොහාන් සුභාරංචිය  II. මතෙව් සුභාරංචිය
   III. ලූක් සුභාරංචිය  IV. මාක් සුභාරංචිය
9. “දෙවි සමිඳාණන් වහන්සේ හම් වස්ත්‍ර සාදා ආදම්ට හා ඔහුගේ භාර්යාවට පැළඳ වූ සේක” මින් අදහස් වන්නේ
   I. එකළ හම් වස්ත්‍ර ප්‍රචලිත බව  II. ආදම් හා ඒවට දඬුවම් දුන් බව
   III. දේව කරුණාව ආදරය හා රැකවරණය බව  IV. දෙවිදුන් තම අභිමතය ඉටු කළ බව

10. සමිදාණන් වහන්සේ කායින්ට කතා කොට “නුඹ මෙතරම් කිපී දුර්මුඛ වී සිටින්නේ මන්ද නුඹ යහපත කරන්නනෙහි නම් නුඹ පිළිගනු ලබන්නෙහිය.....”මෙම පාඨය ඇතුළත් ග්‍රන්ථය

I. නික්මයාම
II. උත්පත්ති
III. ලෙවී ව්‍යවස්ථාව
IV. ගණන් කථාව

11. “ආදර පුතුනි මාගේ දිවියෙහි තබුණු එකම පැතුම ඔබ කිතුණුවකු වනු දැකීමයි, මා පැතුවාටත් වඩා සමිදාණෝ මට දී ඇත, දෙවියන් වහන්සේට ස්තෝත්‍ර වේවා!” ලෙස පැවසූ සාන්තුවරිය

I. ශු. තෙරේසා මව්තුමිය
II. ශු. හෙලේනා මුනිතුමිය
III. ශු. ඇග්නස් මුනිතුමිය
IV. ශු. මොනිකා තුමිය

12. මාර්ගෝපකාර දිව්‍ය සත්ප්‍රසාදය පිළිබඳව සඳහන් වන්නේ

I. කතෝලික සභා ධර්මොපදේශය
II. 1 කොරෙන්ති ලිපිය
III. ජාකොබ් ලිපිය
IV. මහෝපදේශය

13. “ශරීරය අනාචාරය පිණිස නොවේ, එය සමිදාණන් වහන්සේ උදෙසාය” යනුවෙන් කොරෙන්ති සභාවට අවවාද උපදෙස් දුන්නේ

I. ශු. පේදුරුතුමා
II. ශු. ලූක් තුමා
III. ශු. ජොහාන් තුමා
IV. ශු. පාවුළු තුමා

14. ක්‍රිස්තුන් වහන්සේගේ බෞතීස්මය එක සමාන ආකාරයට දකින කතුවරුන් තිදෙනා............................. වේ.

I. ශු. මාක්, ජොහාන්, ලූක්
II. ශු. ජොහාන්, මතෙව්, ලූක්
III. ශු. මතෙව්, මාක්, ලූක්
IV. ශු. මාක්, මතෙව්, ජොහාන්

15. “මා නුඹ කුසෙහි පිළිසිඳ ගැනීම ඇති කරගන්නටත් පෙර පටන් මම නුඹ හඳුනා ගතිමි.නුඹේ උපතටත් පෙර මම නුඹ කැප කළෙමි” යනුවෙන් දෙවියන් වහන්සේ ආමන්ත්‍රණය කරන්නේ

I. දිවැසිවර යෙසායාට
II. දිවැසිවර එසකියෙල්ට
III. දිවැසිවර ජෝනාට
IV. දිවැසිවර ජෙරමියාට

**නිවැරදි පිළිතුරු වරහන් තුළින් තෝරා හිස්තැන් පුරවන්න.**

( සොයන්න, දෙපයට, සුරුකම්, එළියක්, ශුද්ධාත්මයාණන්, ජීවනය )

16. ඔබේ වචනය මගේ........................... පහනක්ය, මගේ මාවතට එළියක්ය.

17. පුනර්ජීවනයද ........................... ද මම වෙමි.

18. අප හැකිකම් අප ........................... පිණිස යොදවමු ජන සේවේ.

19. අපගේ ජීවිත........................ වහන්සේගේ මන්දිරය වේ.

20. ඉල්ලන්න ඔබට දෙනු ලැබේ ........................... ඔබට සම්බ වේ.

## II කොටස

**පළමු ප්‍රශ්න අන්වාර්ය වේ. තවත් ප්‍රශ්න 4කට පිළිතුරු ලියන්න.**

1. i. ජොහාන් සුභාරංචියේ අරමුණු 2ක් ලියන්න.
ii. නෝවාගේ කැපී පෙනෙන ලක්ෂණ 2ක් ලියන්න.
iii. ශුද්ධාත්මයාණන්ට විරුද්ධ පව් 2ක් ලියන්න.
iv. පාරිශුද්ධ ජීවිතයක් ගත කිරීමට අවශ්‍ය වන කරුණු 2ක් ලියන්න.
v. සහෝදර ප්‍රේමයට විරුද්ධ පාප 2ක් ලියන්න. (4x5=20)

2. i. උයනෙහි තිබූ ගස නම් කරන්න. (ලකුණු 02)
ii. දෙවියන් වහන්සේ විසින් ආදම්ට දුන් දඬුවම් 3ක් ලියන්න. (ලකුණු 03)
iii. නොමග ගිය ඔබේ මිතුරෙකු යහමගට ගැනීමට ඔබට කළ හැකි මග පෙන්වීම් 5ක් විස්තර කරන්න. (ලකුණු 05)

3. i. ස්වර්ගයට මොරගසන පව් 2ක් ලියන්න. (ලකුණු 02)
ii. පිවිතුරු ජීවිත ගත කළ පුද්ගලයන් 3 දෙනෙකු නම් කරන්න. (ලකුණු 03)
iii. අද සමාජයේ දරුවන් නොමග යන මාර්ග 5ක් ලියා ඒවායින් වැළකී සිටීමට පියවර ගන්නා ආකාරය විස්තර කරන්න. (ලකුණු 05)

4. i. එළියා දිවැසිවරයා විසින් දෙවියන් වහන්සේට පූජාසානයක් ඉදිකළ ස්ථානය නම් කරන්න. (ලකුණු 02)
ii. දිනපතා දෙව්පියාණන් වහන්සේට යාච්ඤා කරන විට යාච්ඤාවක ඇතුළත් විය යුතු අංග 3ක් ලියන්න. (ලකුණු 03)
iii. විවිධ දුක් කරදර වලට මුහුණ පෑම නිසා දෙවිදුන් කෙරෙහි විශ්වාසය හීන වූ ඔබේ මිතුරෙකුට දෙවිඳු ඇදහිල්ල වර්ධනය කර ගැනීමට ඔබ දෙන උපදෙස් 5ක් ලියා විස්තර කරන්න. (ලකුණු 05)

5. i. රෝගීන් සුව කිරීම සඳහන් වන ලිපිය නම් කරන්න. (ලකුණු 02)
ii. රොගීන්ගේ ආලේපය ලබා ගත හැකි තිදෙනෙකු නම් කරන්න. (ලකුණු 03)
iii. රොගීන්ගේ වෙනුවෙන් ඔබෙන් ඉටුවිය යුතු යුතුකම් 5ක් ලියා විස්තර කරන්න. (ලකුණු 05)

6. i. භාවනාව යනු සොයා යාමකි.මෙම සොයා යෑමේදී විමසිලිමත් වන කරුණු 2 ලියන්න. (ලකුණු 02)
ii. අසීසයේ ප්‍රැන්සිස් තුමාගේ යාච්ඤාවට අනුව ප්‍රේමයේ ගුණාංග 5ක් ලියන්න. (ලකුණු 03)
iii.කිතුණු දරුවෙකු ලෙස ඔබගේ අධ්‍යාත්මික ජීවිතය වර්ධනය කර ගැනීමට යාච්ඤාව ඉවහල් වන ආකාරය කරුණු 5කින් විස්තර කරන්න. (ලකුණු 05)

7. **කෙටි සටහන් ලියන්න.**
i. ශුද්ධවූ ජුසේවාස් මුනිතුමා
ii. සලමොන් රජතුමා
iii. ලෝකයේ ආලෝකය මම වෙමි.
iv. නව ගිවිසුම (2x5=10)